**බුද්ධශාසන අරමුදල - 2013**

**------------------------------**

බුද්ධශාසන අරමුදලේ 2013 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් හා වියදම් ගිණුම, අරමුදල් වෙනස් වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1990 අංක 35 දරන බුද්ධශාසන අරමුදල් පනතේ 12(2) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) හි ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

**-----------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙළ කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

**------------------------**

උත්තරීත්තර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ.

**1.4. මතය ව්‍යාවනය සඳහා පදනම**

**-------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවල ප්‍රතිඵලයක් ලෙස ශේෂ පත්‍රයේ, ආදායම් වියදම් ගිණුමේ, අරමුදල වෙනස්වීමේ ප්‍රකාශනයේ සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ වාර්තාගත වූ හෝ වාර්තාගත නොවූ හෝ විෂයයන් සහ මූලිකාංගවලට අදාළව කවර හෝ ගැලපීම් කිරීමේ අවශ්‍යතාවයක් තිබුණේදැයි තීරණය කිරීමට මට නොහැකිය.

**02. මූල්‍ය ප්‍රකාශන**

**---------------**

**2.1 මතය ව්‍යාවනය**

**-----------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මට නොහැකි විය. ඒ හේතුකොට ගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**----------------------------------------**

**2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති**

**------------------------------------------**

සමාලෝචිත වර්ෂයේ මිලට ගෙන තිබුණු පිරිවැය රු. 215,690 ක්වූ ලී බඩු උපකරණ සහ සවිකිරීම් සමාලෝචිත වර්ෂය තුළදී භාවිතයට ගෙන තිබුණද එම වත්කම්වල ඵලදායී ජීවිත කාලය තක්සේරු කර ක්ෂය කිරීමට පියවර ගෙන නොතිබුණි.

### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

-----------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ඉකුත් වර්ෂ සඳහා වාර්ෂික ගිණුම් පිළියෙළ කිරීම වෙනුවෙන් පෞද්ගලික සමාගමකට සමාලෝචිත වර්ෂයේදී ගෙවන ලද රු. 100,000 ක මුදල අතීතානුයෝගීව ගැලපුම් කිරීමකින් තොරව වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගතකර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළදී රු. 20,559,930ක් පරිත්‍යාග ලෙස අරමුදලට ලැබී තිබුණු අතර ඉන් රු. 20,354,829 ක මුදලක් පරිත්‍යාගකරුගේ ඉල්ලීම මත පෞද්ගලික සංවිධානයකට නිදහස් කර තිබුණි. මෙම පරිත්‍යාග ලැබීම් හා ගෙවීම් ආදායම් වියදම් ගිණුමෙහි පිළිවෙලින් ආදායම් හා වියදම් ලෙස වෙන් වෙන්ව පෙන්වා නොතිබුණි.

### 2.2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2009 වර්ෂයේදී ආරම්භ කර තිබූ පාලි අට්ඨ කතා ඉංග්‍රීසියට පරිවර්තනය කර මුද්‍රණය කිරීමේ ව්‍යාපෘතිය ආරම්භ කර අවුරුදු 05 ක් ඉක්ම ගොස් ඇතත් ව්‍යාපෘතියේ කටයුතු නිම කර බුද්ධශාසන අරමුදලට පොත් භාර නොදීම හේතුවෙන් ව්‍යාපෘතිය වෙනුවෙන් අත්තිකාරම් ලෙස ගෙවා තිබූ රු. 1,080,165 ක මුදල මෙතෙක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2007 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා පාලි හා බෞද්ධ විශ්ව විද්‍යාලයට ගෙවිය යුතු ලෙස මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන රු.325,000 ක මුදල නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

### 2.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

-----------------------------------

(අ) සමාලෝචිත වර්ෂය තුළදී අරමුදල වෙත ලැබී තිබූ එකතුව රු. 20,718,390 ක් වූ පරිත්‍යාග හා පොත් විකුණුම් ආදායම සඳහා විධිමත් පරිදි ලදුපත් නිකුත් නොකර ගිණුම්ගතකර තිබුණි. විධිමත් පරිදි ලදුපත් නිකුත් කිරීමේ ක්‍රියාපටිපාටියක් නොමැතිවීම හේතුවෙන් සියලු ලැබීම් ගිණුම්ගත වූයේද යන්න විගණනයේ දී තහවුරු කරගැනීමට නොහැකිවිය.

(ආ) ගිණුම්වල වූ පහත දැක්වෙන එක් එක් අයිතමයන් ඉදිරියෙන් දැක්වෙන සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීය.

| | විස්තරය | වටිනාකම | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|---|
| | | රු | |
| (i) | 2013 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු සාමනේර ආයතන දීමනාව | 632,500 | ගෙවිය යුතු දීමනාව හා ගෙවන ලද දීමනාව දැක්වෙන පරිදි ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| (ii) | ගෙවිය යුතු පොළී - ධාතුමළු විහාරය | 107,217 | වගකීමක් ලෙස හඳුනාගැනීමට අදාළ ලේඛන හා ගණනය කිරීමේ විස්තර |

| | | | |
|---|---|---|---|
| (iii) | අලෙවිය සඳහා වූ පොත් | 8,248,169 | සමීක්ෂණ මණ්ඩල වාර්තා/භාරයේ ඇති බවට සනාථ කිරීම් / තොග පොත් |
| (iv) | ලැබිය යුතු - පොත් අලෙවි ආදායම | 3,696,211 | සනාථ කිරීමේ ලේඛන |
| (v) | ලැබිය යුතු භාණ්ඩාගාර බිල්පත් | 2,031,609 | ආයෝජන සහතික, ආයෝජන ලේජරය, විස්තරාත්මක ලේඛන. |

**2.3 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණයන්ට අනුකූල නොවීම**

---------------------------------------------------------------------------

විගණනයේදී නිරීක්ෂණය වූ නීති රීති යනාදියට අනුකූල නොවීම් පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1990 අංක 35 දරන බුද්ධශාසන අරමුදල් පනත : | |
| | (i) 4.1 වගන්තිය | පාලක මණ්ඩලයට සහාය වීම සහ උපදෙස් දීම සඳහා උපදේශක කමිටුවක් පත්කර නොතිබුණි. |
| | (ii) 6 වගන්තිය | 2004 වර්ෂයේ සිදු වූ සුනාමි අනතුරින් හානියට පත් වූ විහාරස්ථාන ගොඩනැගීම වෙනුවෙන් ලැබී තිබුණු රු. 1,348,796 ක මුදලක් සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වාම අදාල කාර්යයට යොදවා නොතිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | |
| | (i) මුදල් රෙගුලාසි 396 (ඇ) | නිකුත් කළ නමුත් ඉදිරිපත් නොකළ මාස හය ඉක්මවූ රු. 147,800 ක චෙක්පත් 14 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. |
| | (ii) මුදල් රෙගුලාසි 754 | අරමුදල විසින් බඩු වට්ටෝරු පොතක් යාවත්කාලීනව නඩත්තු කර නොතිබුණි. |
| | (iii) මුදල් රෙගුලාසි 756 | අරමුදල සතු ධර්ම ග්‍රන්ථ තොග සම්බන්ධයෙන් වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයක් සිදුකිරීමට කටයුතුකර නොතිබුණි. |
| (ඇ) | අංක පී.එෆ් 423 දරන හා 2006 දෙසැම්බර් 22 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛය : | |
| | (i) 4.1 (අ), (ආ), (ඇ) ඡේද | චක්‍රලේඛ විධිවිධාන පරිදි අරමුදලෙහි අරමුණුවලට අනුකූලව අයවැය ලේඛනයක් පිළියෙළ කර අදාළ අනුමැතිය ලබාගැනීමෙන් පසුව අරමුදලේ වියදම් දැරිය යුතු වුවද එසේ සිදු කර නොතිබුණි. |

(ii) 4.2 (ඈ) ඡේදය

බැංකු ගිණුම් සසඳා ප්‍රගතිය පිළිබඳව එක් එක් කාර්තු සඳහා වූ වාර්තා රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කර නොතිබුණි.

**3. මූල්‍ය සමාලෝචනය**

**---------------------**

**මූල්‍ය ප්‍රතිඵල**

**--------------**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අරමුදලේ මෙහෙයුම් කටයුතුවල අතිරික්තය රු. 41,981,227 ක් විය. ඊට අනුරූපී ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.27,725,095 ක් විය. ඒ අනුව ඉකුත් වර්ෂය සමඟ සැසදීමේදී මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 14,256,132 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

**--------------------------**

**4.1 කාර්යසාධනය**

**-----------------**

බුද්ධශාසන අරමුදලේ පාලක මණ්ඩලය විසින් ගන්නා ලද තීරණයක් අනුව පාලි අට්ඨකථා පොත් හා වෙනත් බෞද්ධ පොත් සිංහලට පරිවර්තනය කිරීම මුද්‍රණය කිරීම සහ විකිණීම යන කටයුතු පෞද්ගලික මුද්‍රණාලයකට පවරා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) බෞද්ධ පොත් පරිවර්තනය මුද්‍රණය කිරීම සහ විකිණීම සම්බන්ධයෙන් 2006 ජනවාරි 25 දිනැති අංක 08 දරන ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.2 වගන්තිය ප්‍රකාරව මිල කැඳවීමකින් තොරව පෞද්ගලික ආයතනයක් වෙත භාර දී ඒ සඳහා 2009 සිට 2011 දක්වා වර්ෂ 03 ක කාලයක් තුළ රු.8,569,440 ක මුදලක් අත්තිකාරම් වශයෙන් ගෙවා තිබුණි.

(ii) පරිවර්තනය සහ මුද්‍රණය කළ පොත් සහ විකුණන ලද පොත් සංඛ්‍යාව, ඉතිරි පොත් සංඛ්‍යාව, වෙන් වෙන්ව හඳුනාගත හැකි පරිදි ලේඛන පවත්වා නොතිබුණි.

**4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

**---------------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) බුද්ධශාසන අරමුදල් පනත අනුව, අරමුදල ආදායම් බදු වලින් නිදහස් කර තිබුණද අරමුදලට අයත් ස්ථාවර තැන්පතු පොළී ආදායම මත සමාලෝචිත වර්ෂයේදී ජාතික ඉතිරි කිරීමේ බැංකුව විසින් රඳවාගෙන තිබුණු රු.47,000 ක් ඇතුළත්ව රු. 394,381 ක රඳවා ගැනීමේ බදු නැවත ප්‍රතිපූර්ණය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සාමනේර ආයතන මාසික දීමනා ගෙවීම් සම්බන්ධයෙන් පහත දුර්වලතා හා අඩුපාඩු නිරීක්ෂණය විය.

(i) සාමනේර ආයතන සඳහා ගෙවීම් ලේඛනයක් නඩත්තු කළද එය විධිමත්ව හා යාවත්කාලීනව පවත්වාගෙන ගොස් නෙතිබුණි.

(ii) සමාලෝචිත වර්ෂයේ දී සාමනේර ආයතන 8කට ගෙවිය යුතුරු.285,000 ක දීමනාව ගෙවා නොතිබුණි.

## 4.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

සාමනේර කැපකරු දායක ක්‍රමයට අයත්, රු. මිලියන 28 ක ආයෝජනයෙන් ලැබෙන පොළී ආදායම උපයෝගී කර ගෙන සාමනේර කැපකරු දායක ක්‍රමය ක්‍රියාත්මක කළ යුතුව තිබුණද ඉකුත් වර්ෂවලදී මෙන්ම සමාලෝචිත වර්ෂයේදී ද එය නිසි පරිදි ක්‍රියාත්මක වී නොතිබුණි. සමාලෝචිත වර්ෂය තුළ ඉහත ආයෝජනයෙන් රු. 3,502,809 ක වාර්ෂික පොළී ආදායමක් උපයා තිබුණු නමුත් විධිමත් සැලසුමක් නොවීම නිසා සාමනේර කැපකරු දායක ක්‍රමයට දායක කර තිබුණේ රු. 383,675 ක් හෙවත් සියයට 11ක් පමණි.

## 4.4 නිෂ්ක්‍රීය වත්කම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ව්‍යාපෘති 12 ක් වෙනුවෙන් අරමුදල වෙත පරිත්‍යාග කරන ලද රු. 1,448,096 ක මුදලක් වර්ෂ 10 කට අධික කාලයක සිට අරමුණුගත කාර්යයන් වලට හෝ පාලක මණ්ඩලය අනුමත කරන කාර්යයන්ට හෝ යෙදවීමෙන් තොරව නිශ්කාර්යව පැවතුණි.

(ආ) 2007 වර්ෂයේ සිට පවතින රු. 15,000 ක් වන සිව්පස ආධාර ගිණුමේ ශේෂයත් 2008 වර්ෂයේ සිට පැවතෙන රු. 1,348,796 ක් වූ සුනාමි ආධාර ගිණුමේ ශේෂයත් කිසිදු කාර්යයක යෙදවීමෙන් තොරව නිෂ්කාර්යව පැවතුණි.

## 4.5 දෘශ්‍ය අක්‍රමිකතා

අරමුදලේ හිටපු ගණකාධිකාරිවරිය විසින් 2012 වර්ෂයේ මැයි මාසයේ සිට අගොස්තු මාසය දක්වා මාස 04 ක කාලයක් සඳහා පාලක සභාවෙන් ගෙවීමට අනුමත කරන ලද මසකට රු.8,926 බැගින් වූ දීමනාව වෙනුවට පාලක සභාවේ අනුමැතියට පටහැනිව මාසයකට රු.42,302 බැගින් ලබාගැනීම හේතුවෙන් රු.133,504 වැඩියෙන් ලබා ගෙන තිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

## 5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2006 දෙසැම්බර් 22 දිනැති අංක පීඑෆ් 423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 4.3 ඡේදය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී මාස 2 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබූ අතර සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර තිබුණේ 2014 මැයි 05 දිනදීය. එම ගිණුම් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කර නොතිබීම පිළිබඳව විගණනයෙන් පෙන්වා දීමෙන් අනතුරුව නැවත 2014 ජූලි 23 දින කෙටුම්පත් මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර තිබූ අතර සංශෝධිත අවසන් ගිණුම් 2014 ඔක්තෝබර් 31 දින විගණනය වෙත ඉදිරිපත් කර තිබුණි.

## 5.2 සංයුක්ත සැලැස්ම

අරමුදලට අදාල අරමුණු ඉටුකර ගැනීම සඳහා සමාලෝචිත වර්ෂයද ආවරණයවන සංයුක්ත සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

## 5.3 ක්‍රියාකාරි සැලැස්ම

සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙළ කර පාලක මණ්ඩලයට 2013 දෙසැම්බර් 03 දින ඉදිරිපත් කර තිබුණි. එම සැලැස්මට අනුව ව්‍යාපෘති තුනක් සැලසුම් කර තිබුණද භෞතික කාර්යසාධනය දක්වා තිබුණේ ව්‍යාපෘති 2 ක් සම්බන්ධයෙන් පමණි.

## 5.4 අභ්‍යන්තර විගණනය

------------------------

සමාලෝචිත වර්ෂයේදී අරමුදලේ අභ්‍යන්තර විගණන කටයුතු සිදු කර නොතිබුණි.

## 6. පද්ධති හා පාලන

-------------------

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු පිළිබඳව වරින් වර අරමුදලේ ලේකම්වරයා දැනුවත් කරන ලද අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුවිය යුතුය.

(අ) අරමුදල් ආයෝජනය හා උපයෝජනය
(ආ) ගිණුම්කරණය
(ඇ) පොත් මුද්‍රණය , ගබඩාකරණය හා අලෙවිකරණය.
(ඈ) වත්කම්
(ඉ) අයවැය